**ශීර්ෂය 250 -රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මතය**

------

රාජ්‍ය ගිණුම්දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම්දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 10දිනගණන්දීමේ නිලධාරී වෙතනිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ගිණුම්දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේදුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන්හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 06 ක් සඳහා රු. 34,472,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු. 28,449,851 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 ක සිට සියයට 91 ක පරාසයක පැවතුණි. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කලයුතු වීම. | අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වීම් සිදු වී ඇත. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(ඇ) ඡේදයේ උපදෙස්වලට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයයන් 04 ක් යටතේ එකතුව රු.136,066 ක බැරකම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු අතර බැරකම් ගිණුම්ගත කිරීම විධිමත් කලයුතු වීම. | මෙම බැරකම් 2019 වර්ෂයට අදාල වුවත්, ගිණුම් වර්ෂය තුළදී පැන නැගුණු බැරකම් නොවේ. අදාල හිමිකම්පෑම් 2020 වර්ෂයේදී සිදු වූ බැවින් ගිණුම් වර්ෂය තුළ නිරවුල් කළ නොහැකි විය. |

### 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිලිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මියගිය නිලධාරියෙකුගෙන් වසර 10 ක සිට අයවිය යුතු රු. 164,953 ක ණය ශේෂය හා සේවය හැර ගිය නිලධාරියෙකුගේ වසර 06 ක සිට පැවත එන රු. 132,846 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම | රු. 164,953 ක් වූ හිඟ ණය ශේෂය අය කර ගැනීම සම්බන්ධයෙන් 2018.11.29 දින මෙම දෙපාර්තෙමේන්තවේ නිළධාරීන් ජාතික රක්ෂණ භාර අරමුදෙල් ප්‍රධාන විධායක නිළධාරි සමග සාකච්ඡා කරන ලදී. අයවීමට ඇති ශේෂය වන රු.132,846 අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින්නඩු පවරා ඇත. |

## 2.4 වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්

### 2.4.1 විවිධ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දින වනවිට රු.173,004,106 ක් වූ විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.160,584,099 ක් වී තිබුණි. ඒ අනුවහිඟ ශේෂයෙන් රු.18,741,792ක් හෙවත් සියයට 11ක් පමණක් වර්ෂය තුළදී අය කර ගෙන තිබුණි. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් පසු විපරම් කටයුතු කරමින් හිඟ මුදල් අයකර ගැනීමට අදාල ආයතනවලට උපදෙස් හා සහාය ලබාදෙනු ලබයි. . |
| (ආ)2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 11 කට අදාළව සමස්ථහිඟ අත්තිකාරම් ශේෂය රු.160,584,099 ක් වූ අතර ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තු 9 ක හිඟ ණය ශේෂ එකතුව වූ රු.154,262,314 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන බව නිරීක්ෂණය විය. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | දිස්ත්‍රික් ලේකම්කාර්යාල හා අදාල උප ආයතන අතර සිදුවූ ගනුදෙනුවලට අදාලව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් වාර්තා කරන තොරතුරු පමණක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සතුව ඇති අතර මෙම උප අත්තිකාරම්හි හිඟ ශේෂ අයකර ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඍජුව මැදිහත් වීමට හැකියාවක් නොමැත. කෙසේ වෙතත්නිරන්තරව පසුවිපරම් සිදුකරමින් අදාල ආයතනවලට උපදෙස් හා සහාය ලබාදෙමින් අත්තිකාරම් අයකර ගැනීම සඳහා අතරමැදියෙකු වශයෙන් ක්‍රියා කරමින් අදාල හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් තවදුරටත් කටයුතු කරනු ලබන බවද කාරුණිකව දන්වමි. |
| (ඇ)2019 දෙසැම්බර් 31 දිනට ආයතන 11 කට අදාලව එකතුව රු.160,584,090ක් වූ හිඟ ණය ශේෂ අයවීම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) 2004/2005 වර්ෂවල වී මිලදී ගැනීම සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතියට නිදහස් කළ මුදලින් ඉතිරි රු.2,183,000 ක ශේෂය 2019 දෙසැම්බර් 31 දිනටරු.5,000 ක් වූ මාසික වාරිකවලින්ම අයකර ගැනීමට කටයුතු | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ පැවති සාකච්ඡාවලදී ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතියවිසින් මාසිකව අයවන රු.5,000 ක මුදල ප්‍රමාණවත් නොවන බැවින් හිඟ මුදල එකවර නිරවුල් කිරීමට හෝ නැතිනම් අවම වශයෙන් මාසිකව රු.25,000 |

| | | |
|---|---|---|
| කර තිබුණි. එසේ අයකර ගැනීම සිදු වුවහොත් ඉහත කී හිඟ මුදල අයවීමට ඉදිරි වර්ෂ 36 කපමණ කාලයක් ගත වන බව නිරීක්ෂණය විය. | | බැහින් පියවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලද නමුත් ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතිය මේ වන විට ආර්ථික අපහසුතාවයන් මත පවත්වාගෙන යනු ලබන බව එම සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් දන්වා ඇති බව මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් මා වෙත දන්වා ඇත. |
| (ii)ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 2006 වර්ෂයේදී ලබා දී තිබුණු වී මිලදී ගැනීමේ අත්තිකාරම්වලින් 2014 වර්ෂයේපැවතිහිඟශේෂයවූරු.12,560,0 31 කින් 2019 දෙසැම්බර් 31 දිනවනවිටරු.1,793,880 ක්පමණක් අයවී තිබුණි. ඒඅනුවතවදුරටත්හිඟහිටිශේෂයරු.10,7 66,151 ක්වූ අතර සමාලෝචිතවර්ෂයතුළකිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | - එම - | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ පැවති රැස්වීම් වාරයන්හිදී හිඟ අත්තිකාරම් ශේෂ පියවීමට නොපමාව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.<br>කෙසේ නමුත්, අදාල ආයතන කැඳවා අත්තිකාරම් නිරවුල් කර ගැනීමට උපදෙස් ලබාදීමට රැස්වීමක් සංවිධානය කිරීමට කටයුතු සූදානම් කළ නමුත් මතුවූ වසංගත තත්ත්වය හේතුවෙන් එම අවස්ථාව මඟ හැරී ගියබැවින්ඉදිරියේදී රැස්වීම් වාර පවත්වා අත්තිකාරම් නිරවුල් කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගතිමි. |
| (iii)කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව 2008 වර්ෂයට පෙර සිට පැවත එන රු. 349,477.50 ක ණය ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා කටයුතු කර නොතිබුණි. | - එම - | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පියවිය යුතු රු.349,477 ක මුදල නිරවුල් කරන ලෙස අදාල ආයතනය දැනුවත් කර ඇති අතර අදාල මුදල නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් කරගතිමි. |
| (iv)සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති අනුරාධපුර ශික්ෂණ රෝහලේ සේප්පුවේ තිබී 2019 මාර්තු 02 දින සොරාගෙන තිබුණු මුදල් පියවා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු අත්තිකාරම්රු. 321,785 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | - එම - | අනුරාධපුර ශික්ෂණ රෝහලේ සිදුව ඇති මුදල් සොරකම හේතුවෙන් සිදුව ඇති පාඩුව පියවා ගැනීම සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත රු. 6,321,785 ක අත්තිකාරම් මුදලක් ලබා දී ඇත.<br>මේ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල ආයතනයට උපදෙස් ලබා දී ඇත. |
| (v) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් | - එම - | බොහෝ ගොවිජන සේවා මධ්‍යස්ථාන |

| | | |
|---|---|---|
| කාර්යාලයෙන් 2015 වර්ෂයට අදාලව අයවිය යුතුව පැවති රු. 38,097,815 කින් 2019 දෙසැම්බර් 31 දින වනවිට හිඟ ශේෂය රු. 34,033,861 ක් වූ අතර ඒ අනුව 2019 වර්ෂය අවසානය වනවිට අයවීම් රු. 4,063,954 හෙවත් සියයට 11 ක් විය. මේ අනුව හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලියෙහි මන්දගාමී බවක් නිරීක්ෂණය විය. | | හා විවිධසේවා සමූපකාර සමිති ආර්ථික අපහසුතා මත පවත්වාගෙන යනු ලබන බැවින් හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීම දුෂ්කර වී ඇති අතර හිඟ මුදල් අයකර ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගනිමි. |
| (vi) පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ ශේෂය රු. 55,927,666 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේ සමස්ථ හිඟ මුදලින් සියයට 35 ක් විය.ඉන් 2018 වර්ෂය තුලවී අලෙවි මණ්ඩලයේ කුරුප්පු හන්දියේ සහල් මෝල පැවැත්වීමේ අලාභය රු. 769,428 ක් හා ආහාර කොමසාරිස් වෙත සහල් නිකුත් කිරීමේ අලාභය රු. 13,018,114 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 හා 113 අනුව කටයුතු කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යොමුකර ඇති බව දන්වා තිබුණද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | - එම - | රු. 13,018,114ක අලාභයන් සඳහා මු.රෙ. 109 හා 113අනුව කටයුතු කිරීමට ස්වදේශකටයුතු අමාත්‍යාංශයට යොමුකර ඇති අයදුම්පත් මෙතෙක් අප දෙපාර්තමේන්තුවට ලැබී නොමැති අතර ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට සටහන් කරගනිමි. |
| (vii)කොළඹ මහ රෝහලේ දන්තායතනයේ 2002 ජනවාරි 22 දිනසිදුවී තිබූ වැටුප් මංකොල්ලයට අදාලව අධ්‍යක්ෂ මහ රෝහල - කොළඹවෙත ලබා දී තිබූ රු. 2,408,460 ක අත්තිකාරම් ශේෂය, 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ අලාභ ලෙස පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | - එම - | කොළඹ දන්තායතනයේ සිදුවූ වැටුප් මංකොල්ලයට අදාලව මාළිගාකන්ද උසාවියේ නඩුවක් විභාගවන අතර අදාල නඩු කටයුතු අවසන් වීමෙන් පසු මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අපේක්ෂා කෙරේ |
| (viii)ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ සිට පැවත එන රු. 1,652,917 ක හිඟ ශේෂය නිරවුල් කිරීමට සතොස ආයතනයට මූල්‍ය හැකියාවක් නොමැති බව දන්වා තිබුණි. එමෙන්ම අදාල ශේෂය කපා හැරීම සඳහා මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | - එම - | එම මුදල් කපා හැරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේනිර්දේශය සහිතව ඉදිරිපත් කළ මු.රෙ. 109අයදුම්පත්ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නොමැති වීම හේතුවෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් නොකරන ලදී. |

| | | |
|---|---|---|
| (ix)අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු. 45,499,095 ක් වූ අතර එය සමස්ථ හිඟ මුදලින් සියයට 28 ක් විය. 2019 වර්ෂය තුල අදාල හිඟ මුදලනිරවුල් කිරීම රු. 200,000 ක් හෙවත් සියයට 0.44 ක්පමණක් විය. | - එම - | අම්පාර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙතින් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ගෙවීම් පැහැර ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, නඩු කටයුතු හරහා අදාල මුදල් අයකර ගැනීමට බලාපොරොත්තු වන බවත් හා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව හා සතොස ආයතනය වෙතින් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නොපමාව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිඵල (Out Come)ලබා නොගැනීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව අත්තිකාරම් "බී" ගිණුම් අධීක්ෂණය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වූ අතර නියැදි විගණන පරික්ෂාවේදි අනාවරනය වු පරිදි, ආයතන 70 කට අදාලව වසර ගණනාවක සිට පැවත එන, අත්තිකාරම්"බී" ගිණුම්වල විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කල හා සේවය හැරයෑම් වලට අදාල එකතුව රු.602,462,162 ක අය නොවන ශේෂ පැවතුණි. තවද 2018 ජනවාරි 01 දින සිට ඉදිරියට විශ්‍රාම ගිය හා මියගිය නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට අදාල උපදෙස් ලබා දී තිබුණද හිඟ ණය ශේෂ අයකර ගැනීම පිළිබඳව මෑත කාලයේදී උපදෙස් ලබා දී නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම | අත්තිකාරම් "බී" ගිණුම් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ඉතා ඉහල මට්ටමක පවතින ආයතන 10 ක් පළමු කාණ්ඩය ලෙස තෝරාගෙන ඉන් ආයතන 7 ක් මේ වන විට කැඳවා රැස්වීම් පවත්වා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. ඉතිරි ආයතන 3 ඉදිරියේදී කැඳවීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ආ)අංක 243/2015 හා 2015 ජූනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, 6003 කාණ්ඩයේ තැන්පත් ගිණුම් ශූන්‍ය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර 2016 වර්ෂයේ සිට එම කටයුතු වාර්ෂික ඇස්තමේන්තුව හරහා සිදු කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එසේ වුවද, අංක 6003 යටතේ වන තැන්පතු ගිණුම් 3 ක රු. මිලියන 10.111 ක් වූ එකතු ශේෂයක් නිරවුල් නොකොට තවදුරටත් ඉදිරියට ගෙන යමින් පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. | මෙම ශේෂයන් අතුරින් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයරු. මිලියන 10 ක හර ශේෂය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර කපා හැරීමට හා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු. 108,029 ක ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමුකර අනුමැතිය ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කෙරේ. |
| (ඇ)2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව, ඉදිරි වසර 10 ඇතුළත මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කිරීම සඳහායෝජනා සම්මත වී තිබුණු අතර ඒ සඳහා 2018 ඔක්තෝබර් 02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එහෙත් එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අදාලව ඉදිරිපත් කළ මාර්ග සැලැස්මේ (Road Map) ඇතුළත් කාර්යයන් වලට අදාල කාල රාමුව විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර තිබුණි. තවදුරටත් මේ සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ. | අයවැය යෝජනා මගින් අපේක්ෂිත අරමුණු අදාල කාල රාමුව තුළ ඉටු කර ගත යුතු වීම | මූලික මාර්ග සැලැස්මේ සිදුකල සංශෝධනයන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා නොගැනීම පිළිගන්නා අතර ඉදිරියේදී ඊට වර්තමාන ප්‍රගතියද ඇතුලත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. |
| i. මූලික මාර්ග සැලැස්ම අනුව 2020 වර්ෂයේදීත්, සංශෝධිත මාර්ග සැලැස්ම අනුව 2021 වර්ෂයේදීත් අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු රාජ්‍ය වත්කම් හඳුනා ගැනීම, මැනීම් කිරීම හා හෙළිදරව් කිරීමට අදාල කාර්යයන් 2022 වර්ෂය අවසන් වනවිට නිමකිරීමට අපේක්ෂාකර තිබුණි. එසේම, ඉඩම් හා ගොඩනැගිලි පවතින සියළු රාජ්‍යආයතන පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණු හෙයින් එම සියළු ආයතන නිවැරදිව හඳුනා ගෙන ඇති බව විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | - එම - | මීට අදාලව ප්‍රමාණාත්මක ප්‍රගතියක් පෙන්නුම් කරන අතර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. බිලියන 1,355 ක් වූ මූල්‍ය නොවන වත්කම්වල අගය 2020 ඔක්තෝබර් වන විට රු. බිලියන 1,389 ක් දක්වා එනම් රු. බිලියන 34 ක් ගිණුම්ගත කිරීමට හැකිවිය. මෙම කාර්යය 2022 වර්ෂය වන විට නිම කිරීමට අපේක්ෂිතය. |
| ii.මූලික සැලැස්ම අනුව 2020 වර්ෂයේදී අවසන් කිරීමට යෝජිතව තිබූ වගකීම් හඳුනාගැනීම, මැනීම හා හෙළිදරව් කිරීමේ කාර්යය සංශෝධිත සැලැස්ම මගින් 2022 දක්වා ප්‍රමාද කර තිබුණි. | - එම - | 2020 වසරේ ඇතිවූ කොවිඩ් වසංගත තත්ත්වය තුළ එම කාර්යයන් නිම කිරිමට 2022 දක්වා දීර්ඝ කිරීමට සිදු විය. |

| | | |
|---|---|---|
| iii. මූලික මාර්ග සැලැස්ම අනුව 2021 වර්ෂයේ දී අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු ආදායම් හා වියදම් හඳුනාගැනීම, මැනීම හා හෙළිදරව් කිරීමේකාර්යයන් සංශෝධිත සැලැස්ම මඟින් 2027 වර්ෂය දක්වා ප්‍රමාද කර තිබුණි. | - එම - | උපචිත පදනම යටතේ ගිණුම් වාර්තාකිරීම 2027 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බැවින් එම කාර්යයන් 2027 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |